යම් අයෙකු කොවිඩ්-19 රෝගියෙකු බවට පත් වීම එම පුද්ගලයාගේ වරදක් ලෙසින් ගත නොහේ.
එනිසා, කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී කොවිඩ්-19 ආසාදිතයන් සහ ආශ්‍රිතයන් පිළිබඳව සමාජය තුළ ගර්හාත්මක හෝ කොන් කිරීමේ ආකල්පයක් ඇති නොවන ලෙසින් වාර්තාකරණය කිරීමත්, කොවිඩ්-19 රෝගීන්ගේ පුද්ගල ගරුත්වය ආරක්ෂා කිරීමත් මාධ්‍ය අත රැඳි වගකීමකි.
නමුත්, ඇතැම් මාධ්‍ය මෙම වගකීම කෙතරම් බැරෑරුම්ව ගන්නේද යන්න පැනයකි.
ඊට උදාහරණ ලෙසින් ලංකාදීප සහ දිවයින පුවත් සිරස්තල වල දැක්වුණු "කොරෝනා කතුන්", "කොරෝනා කත" "කොරෝනා මව" වැනි යෙදුම් දැක්විය හැක. මෙවැනි යෙදුම් කෙතරම් දුරට ජනමාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වන්නේද? මාධ්‍ය තවමත් මෙවැනි යෙදුම් භාවිතා කිරීම පිළිබඳ ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa #Divaina